# විශේෂ නිවේදනයයි !

ඊශ්‍රායලයේ වාසය කරන නැවත ශ්‍රී ලංකාව වෙත පිටත්ව යෑමට බලාපොරොත්තුව සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතයි,

## <u>ශ්‍රී ලංකා රජයේ පූර්ව අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාව බලා ගුවන් ගත වීමෙන් වළකින ලෙස දන්වා සිටීම</u>

කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය හේතුවෙන් ඊශ්‍රායලයේ වෙසෙන රැකියා අහිමි වී හෝ රැකියා ගිවිසුම් අවසන් වීම හේතුවෙන් ශ්‍රී ලංකාව බලා යෑමට අපේක්ෂාවෙන් සිටින ඔබ හට ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා ශ්‍රී ලංකා රජයේ අනුමැතිය/අවසරය ඇතිව ඊශ්‍රායලයෙන් පිටත්ව යෑමට සූදානම් කරනු ලබන විශේෂ ගුවන් යානයක හැර වෙනත් ආකාරයකින් **එනම් තම අභිමතය පරිදි මිළදී ගනු ලැබූ ගුවන් ප්‍රවේශ පත්‍රයක් මගින් ශ්‍රී ලංකාවට ඇතුල් වීමට උත්සහ දරන්නේ නම් එම අවස්ථාවන්හිදී ඔබ හට ශ්‍රී ලංකා රජයේ අදාළ බලධාරීන්ගෙන් ඒ සඳහා අවසර නොලැබෙන බවද ඒ පිළිබඳව සියලුම රටවල පිහිටි ජාත්‍යන්තර සංක්‍රමණ කවුළුද (International Transit Point) ශ්‍රී ලංකා රජය විසින් දැනුවත් කර ඇති බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.**

එබැවින් තම අභිමතය පරිදි ශ්‍රී ලංකාවට පිටත්ව යෑමට ගුවන් ප්‍රවේශ පත්‍රයක් වෙන් කර ගැනීමෙන් / මිළදී ගැනීමෙන් සහ ශ්‍රී ලංකාව බලා ගුවන් ගතවීමෙන් වළකින ලෙසද කාරුණිකව අවධාරණය කරනු ලැබේ.

එමෙන්ම වෙනත් රටක් හරහා ශ්‍රී ලංකාවට යාමට ඔබ විසින් උත්සහ කිරීමේදී එම රටවල් වල ආගමන සහ විගමන බලධාරීන් විසින් නැවතත් ඔබව තමන් පැමිණි රටටම ආපසු හරවා එවීමට කටයුතු කරනු ලබන බවද වැඩිදුරටත් අවධාරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය
2020.09.14